# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ (UCSC) තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධි පාඨමාලාවට අයදුම්කරුවන් තෝරා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද **"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2016/2017"** අත් පොතෙහි 1.2 ඡේදයෙහි සහ 2.2.8.27 ඡේදයෙහි දැක්වෙන විශ්වවිද්‍යාලයකට ඇතුලත්වීම සඳහා වන සුදුසුකම් සපුරා ඇති 2016 අ.පො.ස. (උ.පෙ.) විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

ඉහත සඳහන් උපාධි පාඨමාලාව වෙනුවෙන් බඳවා ගැනීම සලකා බැලීම සඳහා මෙම උසස් අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් වේ. **ඒ අනුව මෙම උපාධි පාඨමාලාවට සලකා බැලීම සඳහා 2016/2017 අධ්‍යයන වර්ෂයට සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන අයදුම්කරුවන් තම කැමැත්තෙහි අනුපිළිවෙලට ඉහත පාඨමාලාවද සඳහන් කරමින් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්කරුවන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.**

**සැ.යු. - යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වන බව සලකන්න.**

**සැලකිය යුතු දිනයන්**

අයදුම්පත් බාරගන්නා අවසන් දිනය : 2017.02.27

යෝග්‍යතා පරීක්ෂණය පවත්වන දිනය : 2017.04.04 අඟහරුවාදා (කොළඹ දී පමණක් පවත්වනු ලැබේ)

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පිළිවෙල**

1. අයදුම්කරුවන්ට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වෙබ් අඩවිය වන http://www.ucsc.cmb.ac.lk හි ඇති මාර්ගගත (Online) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ හැකි අතර, නොඑසේ නම්, පහත දක්වා ඇති ආකෘතියට අනුව A4 **ප්‍රමාණයේ කඩදාසිවල** තමන් විසින්ම ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ගත හැකිය. නිසි පරිදි සකස් කරගත් අයදුම්පත්‍රය හෝ මාර්ගගත (Online) අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත සම්පූර්ණ කර මුදල් ගෙවන ලද රිසිට්පත හා අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිඵල ලේඛණයේ සහතික කරන ලද පිටපත ද සමඟ 2017.02.27 වන දින හෝ ඊට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය, අංක 35, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"IS - Aptitude Test 2016/2017"** යන්න අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත සහ අනෙකුත් ලියවිලි නොනවා **A4 ප්‍රමාණයේ ලියුම් කවරයක** එවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් මෙම අයදුම්පත් අතේ ගෙනවිත් භාරදිය නොහැකිය.

3. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය නමින් ගිණුම් අංක **086-1-001-2-1190316** දරණ මහජන බැංකු ගිණුමට (තිඹිරිගස්යාය ශාඛාව) බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව වු **රු. 1000.00** ක මුදල ගෙවිය යුතුය. මේ සඳහා මාර්ගගත (Online) අයදුම්පත් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් විසින් ඉහත UCSC වෙබ් අඩවියෙන් බාගත (Download) කර ගත් **ගෙවීම් වවුචරයක්** භාවිතා කළ යුතු අතර අනෙක් අයදුම්කරුවන් විසින් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ලබා ගන්නා ලද ගෙවීම් වවුචරයක් භාවිතා කළ යුතුවේ. තමා වෙත ජායා පිටපතක් තබාගෙන මුදල් ගෙවූ කුවිතාන්සියේ අයදුම්කරු සඳහා වූ පිටපත අයදුම්පතේ පිටුපසෙහි අලවා, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය වෙත එවිය යුතු බව කරුණාවෙන් සලකන්න. **මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.**

**සැලකිය යුතුයි**

i. තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා නියමිත විශ්වවිද්‍යාල ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් වෙත පමණක් යෝග්‍යතා පරීක්ෂණය සඳහා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

ii. අපේක්ෂකයා විසින් අවම සුදුසුකම් සපුරා නොමැති නම් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

iii. පහත දක්වා ඇති කරුණු මත ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැක.

  අ) අපේක්ෂකයා විසින් විද්‍යාවේදී තොරතුරු පද්ධති උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබීම.

  ආ) මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) / මුද්‍රිත අයදුම්පත්‍රය අසම්පූර්ණ වී තිබීම.

  ඇ) මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) / මුද්‍රිත අයදුම්පත්‍රය සහ **ගෙවීම් වවුචරය** අදාල ලිපිලේඛන සමඟ අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට එනම් **2017.02.27 වන දිනට පෙර** ලියාපදිංචි තැපැලෙන් විභාග අංශය වෙත නොලැබීම.

iv. අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පවත්වන දිනට පෙර නොලැබුණේ නම් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / විභාග හා ලියාපදිංචි අංශයෙන් විමසීම් කල හැකි අතර, එසේ නැතහොත් ප්‍රවේශ පත්‍රය (Admission Card) **2017.03.30** දින සිට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ (UCSC) වෙබ් අඩවියෙන් බාගත (Download) කර ගත හැක.

v. යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවනු ලබන අතර, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ (UCSC) වෙබ් අඩවියේ ද පල කරනු ලැබේ.

vi. **යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම පමණක් විද්‍යාවේදී තොරතුරු පද්ධති උපාධි පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකමක් නොවේ.**

අයදුම්පත් හෝ යෝග්‍යතා පරීක්ෂණය සම්බන්ධයෙන් සියලු විමසීම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග අංශය වෙත යොමු කළ හැක (දුරකථන අංක 011-2158997 හෝ 011-2581245).

අධ්‍යක්ෂ
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
2017.02.01